හූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ එහි පරිපාලිතයන් - 2024

-----------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ (“කාර්යාංශය”) සහ එහි පරිපාලිතයන්ගේ (“සමූහය”) 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5.1 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5.1 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කාර්යාංශයේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමූහය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව;

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය**

**1.5.1.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂයේදී හා 2024 වර්ෂයේදී එකතු කරන ලද රාජ්‍යභාග ආදායමින් භාණ්ඩාගාරයට යැවිය යුතු ලෙස කාර්යාංශය විසින් ගණනය කරන ලද රු.මිලියන 4, 557.55 ක්, සංචිත යටතේ දක්වා 2024 වර්ෂයට අදාළව මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ රාජ්‍යභාගය රු.මිලියන 1,468.05 ක් හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයේ රඳවා ගත් ඉපයීම් වලින් අඩුකර දක්වා තිබුණි.<br><br>2024 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 3,468.05 ක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණද රු.මිලියන 1,089.5 ක් වූ ගෙවිය යුතු රාජ්‍යභාගය ජංගම වගකීමක් ලෙස දක්වා නොතිබුණි.<br><br>රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක PED/1/GSMB/3/11(i) හා 2023 අගෝස්තු 10 දිනැති ලිපිය ප්‍රකාරව කාර්යාංශය විසින් 2023 සහ 2024 වර්ෂවලට අදාළව රැස්කර ගත් රාජ්‍යභාග ආදායමින් පිළිවෙලින් සියයට 70 සහ සියයට 75 ක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතුය. කාර්යාංශය විසින් 2024 වර්ෂය තුළදී රු.මිලියන 333.64 ක රාජ්‍යභාගයක් පෙර වර්ෂ වලට අදාළව රැස්කරගෙන තිබුණද උක්ත ලිපිය ප්‍රකාරව එම වටිනාකමින් 2023 වර්ෂයට අදාළ රාජ්‍යභාගය හඳුනාගෙන එයින් සියයට 70 ක් භාණ්ඩාගාරයට යැවීමට කටයුතු නොකර සම්පූර්ණ වටිනාකම කාර්යාංශයේ ආදායමක් සේ සලකා ගිණුම්ගත කර තිබුණි. | මෙය ඉදිරියේදී නිවැරදි කරනු ඇත. විගණනය පෙන්වා දී ඇති පරිදි සමාලෝචිත වර්ෂය තුළදී පෙර වර්ෂවලට අදාළව රැස්කර තිබුණු රාජ්‍ය භාග වටිනාකම රු මිලියන 333.64 තුල 2023,2022 ආදී ලෙස පෙර වර්ෂ වලට අදාළව ලබා ගත් වටිනාකම් ද ඇතුළත් වේ. මේ වන විට පවතින ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය තුළින් රාජ්‍ය භාග වටිනාකම් වලට අදාල වර්ෂය කුමක්ද යන්න නිවැරදිව හඳුනාගැනීමට ක්‍රමවේදයක් නොමැති නිසා රාජ්‍ය භාග වටිනාකමට අදාළ වර්ෂය කුමක්ද යන්න ගිණුම්කරණ පද්ධතිය තුළින් හඳුනා ගැනීමට ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා පුද්ගලික ආයතනයක් වෙත දන්වා ඇත. ඒ අනුව 2025 වර්ෂයේ සිට නිසි ක්‍රමවේදයකට අනුව රාජ්‍ය භාග මුදල් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට බලාපොරොත්තු වෙමි. | මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතු එහෙත් කාර්යාංශයේ ආදායමට ගෙන ඇති රාජ්‍යභාගය මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු අතර භාණ්ඩාගාරයට යැවිය යුතු නිවැරදි රාජ්‍යභාගය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් වැලි, පස් හා බොරළු ප්‍රවාහන බලපත්‍ර ගාස්තු ලෙස 2024 වර්ෂය සඳහා ගිණුම්ගත කළ ආදායමින් රු.මිලියන 22.48 ක් 2023 වර්ෂයට අදාළ වූයෙන් 2024 වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | විගණනය දක්වා ඇති කරුණ සඳහා එකඟ වන අතර ඉදිරියේදී නිවැරදි කරනු ඇත. | ප්‍රවාහන බලපත්‍ර ආදායම නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සහකාර අධ්‍යක්ෂ (නීති) ගේ 2025 මැයි 07 දිනැති ලිපිය මගින් 2024 දෙසැම්බර් 31 දිනට බලපත්‍ර 157 ක් සඳහා ලැබිය යුතු රාජ්‍යභාගය රු.මිලියන 24.13 ක් බව විගණනය වෙත දන්වා තිබුණද එම ලැබිය යුතු රාජ්‍යභාගය මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා නොතිබුණි. | විගණනය දක්වා ඇති කරුණ සඳහා එකඟ වන අතර, ඉදිරියේදී ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | ලැබිය යුතු රාජ්‍යභාගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2022 වර්ෂයේ ජනවාරි මස සිට 2024 වර්ෂය අවසානය දක්වා ගනුදෙනුකරුවන් විසින් සෘජුවම කාර්යාංශයේ බැංකු ගිණුමට බැර කර තිබූ රු.මිලියන 19.10 ක ලැබීම් හඳුනාගෙන ගිණුම්ගත කරනු වෙනුවට ගෙවිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | මෙම සෘජු තැන්පතු සම්බන්ධව කාර්යාංශයේ කැනීම් සහ භූ විද්‍යා අංශ වෙත අදාළ ගනුදෙනු කරුවන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ලිපි යොමු කර ඇත. | සෘජු තැන්පතු නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ඉ) | කාර්යාංශයේ පරිපාලිත සමාගම වන ජීඑස්එම්බී ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම වෙත 2016 සිට 2020 කාලයට අදාළව ගෙවිය යුතු රු.මිලියන 5.52 ක් අන්තර් සමාගම් ගනුදෙනුවක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද මෙම වටිනාකම උපචිත වියදම් යටතේ දක්වා තිබුණි. | මෙය ඉදිරියේදී නිවැරදි කිරීම් කරනු ඇත. | පරිපාලිත සමාගම වෙත ගෙවිය යුතු මුදල් අන්තර් සමාගම් ගනුදෙනු ලෙස නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | කාර්යාංශයේ කාර්ය පරිපාටි සංග්‍රහයේ 3.6 වගන්තිය ප්‍රකාරව සුබසාධක අරමුදල සඳහා එක් සාමාජිකයෙකුට මසකට රු.25 බැගින් ආයතනයේ දායකත්වය ලබාදිය යුතු වුවත් ඒ සඳහා වාර්ෂිකව මුදල් වෙන් කිරීමකින් තොරව 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වසර 6 ක කාලසීමාවක් වෙනුවෙන් 2024 වර්ෂයේදී ගෙවන ලද රු.මිලියන 2.96 ක් 2024 වර්ෂයේ සුබසාධක වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. එසේම 2024 වර්ෂයේ සුබසාධක අරමුදල වෙනුවෙන් ආයතනයේ දායකත්වය රු.මිලියන 1.58 ක් සඳහා වෙන් කිරීමක් සිදුකර නොතිබුණි. | මෙය ඉදිරියේදී නිවැරදි කිරීම් කරනු ඇත. | සුභසාධක අරමුදලට ගෙවිය යුතු දායකත්වය සඳහා වෙන් කිරීම් සිදුකර නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.5.1.2 නොසැසඳීම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භූමි පුනරුත්ථාපනය සඳහා බලපත්‍රලාභීන් වෙතින් ලබා ගත් බැංකු ඇපකර, මුදල් බවට පත් කිරීමෙන් පසු ස්ථාවර තැන්පත් ගිණුමක හා ජංගම ගිණුමක තැන්පත් කර තිබුණු මුදල රු.මිලියන 514.44 ක් වුවද එම වටිනාකම නියෝජනය කරනු ලබන ඉඩම් පුනරුත්ථාපන අරමුදල් ගිණුමේ ශේෂය රු. මිලියන 423.27 ක් වූයෙන් ඒ අතර රු.මිලියන 91.17 ක වෙනසක් විය. | කාර්යාංශය බැංකු ඇපකර වලට අදාල චෙක්පත් මහජන බැංකු ගාලුපාර ශාඛාවේ තිබෙන පුනරුත්ථාපන අරමුදල් ගිණුම තුළ තැන්පත් කරනු ලබයි. එහි ශේෂය වරින් වර ස්ථාවර තැන්පතු ගිණුමට මාරු කරනු ලබයි.<br>විගණනය පෙන්වා දී ඇති පරිදි අදාළ වෙනස වන්නේ ස්ථාවර තැන්පතු වලින් ලැබී ඇති පොළී ආදායම නැවත ආයෝජනය කිරීමෙන් ලද පොළිය වේ. එය ඉදිරියේදී වෙනත් ගිණුමකට මාරු කිරීමට කටයුතු කරනු ඇත. | තැන්පත් ගිණුම්වල හා අරමුදල් ගිණුමේ ශේෂය අතර වෙනසක් ඇති නොවන පරිදි කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2023 මැයි 01 වන දිනැති අංක 236/04/2023 දරන කාර්යාංශයේ අභ්‍යන්තර චක්‍රලේඛයේ 5.2 වගන්තිය ප්‍රකාරව අයදුම්කරුගේ ඉල්ලීම පරිදි පුනරුත්ථාපන බැඳුම්කරයෙහි වටිනාකම එකවර බැංකු ඇපකරයක් ලෙස හෝ කාර්යාංශය විසින් නැවත ගෙවනු ලබන තැන්පතුවක් ලෙස මුදලින් අයකරගනු ලැබිය හැකිව ඇති අතර එසේ ලබා ගන්නා මුදල් ජංගම ගිණුමක තැන්පත් කිරීමෙන් පසු ස්ථාවර තැන්පත් ගිණුමකට මාරු කරනු ලබයි. ඒ අනුව 2024 වර්ෂය තුළදී රු.මිලියන 184.88 ක මුදලින් ලද බැඳුම්කර, බැඳුම්කර ගිණුමෙහි දක්වා තිබුණද එම මුදල් බැංකුගත කිරීමට අදාළ ජංගම හා ස්ථාවර තැන්පතු ගිණුම්වල එකතුව රු.මිලියන 174.75 ක් වූයෙන් ඒ අතර වෙනස රු. මිලියන 10.13 ක් විය. | විගණනය පෙන්වා දී ඇති පරිදි පුනරුත්ථාපන බැඳුම්කර ලබා ගැනීමේ කටයුතු කාර්යාංශය ප්‍රධාන කාර්යාලයේ මෙන්ම ප්‍රාදේශීය කාර්යාල මගින් සිදුකරනු ලබයි. එසේ ලබා ගන්නා බැඳුම්කර කාර්යාංශයේ වෙනත් ගිණුමකට තැන්පත් කරනු ලබයි. ප්‍රාදේශීය කාර්යාල මගින් මුදල් තැන්පත් කිරීමේදී කාර්යාංශයේ ප්‍රධාන ගිණුම තුළ පවතී. | මුදලින් ලැබෙන සියලු බැඳුම්කර මුදල් තැන්පත් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.5.1.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

| | විෂයය | මුදල රු.මිලියන | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ප්‍රවාහන, කැණීම් හා ගවේෂණ බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලබා ගෙන තිබූ අත්තිකාරම් | 188.49 | විස්තරාත්මක උපලේඛනයක් හා කාල විශ්ලේෂණයක්. | ප්‍රවාහන, කැණීම් හා ගවේෂණ බලපත්‍ර නිකුත් කිරීම වෙනුවෙන් ලබාගන්නා අත්තිකාරම් මුදල් සඳහා 2023 වර්ෂයේ සිට කාල විශ්ලේෂණය සහිතව උපලේඛනය සකස් කරනු ලබන අතර ඉදිරි ගිණුම් වර්ෂයේදී මෙම උපලේඛන සැකසීමට කටයුතු කරනු ලැබේ. | බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලබාගෙන තිබූ අත්තිකාරම් ශේෂය තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | විදේශ ප්‍රේෂණ | 2.26 | ලද බවට සාක්ෂි | මෙය දීර්ඝ කාලයක් තිස්සේ ආරම්භක ශේෂ ලෙස පැවත එන්නකි. | විදේශ ප්‍රේෂණ ලැබීම් තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.2 භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පරිපාලිත සමාගම වන ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව අනුව විගණන මතය තත්වාගණනය නොකරන ලදී.**

**1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙළෙඳ ණය ගැති ශේෂය තුළ වර්ෂ 5 කට වැඩි කාලයක සිට පවතින ශේෂ වල එකතුව රු.මිලියන 3.64 ක් වූ අතර 2025 මැයි 30 දින වන විටත් මෙම ශේෂ අය කර ගෙන නොතිබුණි. තවද 2016-2023 කාල පරිච්ඡේදයේ මිය යාම, සේවයෙන් ඉල්ලා අස්වූ හා සේවය හැර ගොස් සිටි සේවකයන් 06 දෙනෙකුගේ අයවිය යුතු ආපදා ණය වාරික හා පොලී රු.මිලියන 1.23 ක් අයකර ගැනීමට 2024 වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | මෙම ණයගැතියන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වනවිට ගෙන ඇත. ණය ශේෂ ඉදිරියේදී අයකර ගැනීමට හෝ ගිණුම් තුළින් ඉවත් කිරීමට අදාළ පියවර ගනු ලැබේ. | ණය ශේෂ අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018-2021 කාලපරිච්ඡේදය තුළ කාර්යාංශය විසින් ගෙවා තිබූ විධායක නිලධාරීන්ගේ රු.මිලියන 3.88 ක ජංගම දුරකථන බිල්පත් 2024 වර්ෂය අවසානය වන විටත් අයකර ගෙන නොතිබුණි. | මේ සම්බන්ධව විගණන කළමණාකරන කමිටුව වෙත ඉදිරිපත් කර ඇති අතර, ඒ අනුව කටයුතු කරනු ලැබේ. | මෙම දුරකථන බිල්පත් වියදම අදාළ නිලධාරින්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | බලපත්‍ර ගාස්තු වෙනුවෙන් 2017 සිට 2022 කාල පරිච්ඡේදයේදී කාර්යාංශය වෙත ලැබී තිබූ රු.මිලියන 1.28 ක චෙක්පත් 13 ක් අගරු වී තිබුණද ඒවා අයකර ගැනීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාළව චෙක්පත් 04 ක මුදල වන රු.280,270.37 ක මුදලක් අයකර ගෙන ඇති බවත්, එසේම රු.101,578.07 ක මුදලක් ගෙවීමට නියමිත එක් පුද්ගලයෙකු මියගොස් ඇති බවත් දන්වමි. 2023 වර්ෂයට අදාළව රු.170,411.15 ක චෙක්පතට අදාළ මුදලක් අයකර ගෙන ඇත. 2024 වර්ෂයට අදාළව රු.600,069.55, රු.783,336.26 සහ රු.43,567.49 ක චෙක්පත් වලට අදාළ මුදලක් අයකර ගෙන ඇත. ඒ අනුව ඉතිරි අගරු චෙක්පත් සඳහා මුදල් අයකර ගැනීමට අදාල අංශ දැනුවත් කර ඇත. | චෙක්පත් අගරු වීම හේතුවෙන් ආයතනයට සිදුවූ අලාභය බලපත්‍රලාභීන් ගෙන් කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2024 වර්ෂය අවසානයට බලපත්‍ර 51 ක් සඳහා රු.මිලියන 10.54 ක ලැබිය යුතු රාජ්‍යභාගයක් ජංගම වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණද මෙම වටිනාකම අයකර ගැනීමට අදාළ කිසිදු නීතිමය හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් කාර්යාංශය විසින් ගෙන නොතිබුණි. | මේ සම්බන්ධව ක්‍රියාමාර්ග ඉදිරියේදී ගනු ලැබේ. | මෙම ලැබිය යුතු බලපත්‍ර ගාස්තු මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | වර්ෂ 20 කට අධික කාලයක සිට ඉන්ධන, ගොඩනැගිලි සහ භාණ්ඩ හා සේවා බද්ද වෙනුවෙන් වැඩිපුර ගෙවූ රු.මිලියන 1.15 ක් ඉදිරියට කළ ගෙවීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම දක්වා තිබුණු අතර එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව ක්‍රියාමාර්ග ඉදිරියේදී ගනු ලැබේ. | මෙම ශේෂය කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014-2019 කාල පරිච්ඡේදය තුළ කාර්යාංශයේ නිලධාරීන් වෙත හා බාහිර ආයතන වෙත ගෙවා තිබූ රු.මිලියන 2.92 ක අත්තිකාරම් ද වර්ෂ 05 කට අධික කාලයක සිට ගෙවිය යුතු අත්තිකාරම් ලෙස දක්වා තිබුණු රු.766,983 ක් ද නිරවුල් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග 2024 වර්ෂය අවසානය තෙක් ගෙන නොතිබුණි. එසේම විද්‍යාගාරයේ ලේඛන ප්‍රකාරව සේවා ලබා ගත් පාර්ශවයන් විසින් මුදල් ගෙවන ලද සියලුම කාර්යයන් අවසන් කර තිබියදී 2024 වර්ෂය අවසානයට එකතුව රු.මිලියන 6.31 ක විද්‍යාගාර අත්තිකාරම් ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි | විගණනය පෙන්වා දී ඇති පරිදි කාර්යාංශයේ නිලධාරීන් වෙත සහ දේශීයව සිදු කරන මිලදී ගැනීම් සඳහා බාහිර ආයතන වෙත ගෙවා තිබූ රු.2,920,105 තුළ ඇතුළත් රු.1,500,000 මුදල හැර ඉතිරි අත්තිකාරම් ඉදිරියේදී නිරවුල් කර ගැනීමට කටයුතු කරනු ලබන අතර, රු.1,500,000 ක් සඳහා මේ වනවිට නීතිමය කටයුතු කරගෙන යනු ලැබේ. එසේම රු.1,500,000 සඳහා අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවේද විභාග වෙමින් පවතී. රු.මිලියන 6.31 අත්තිකාරම් ශේෂය සම්බන්ධයෙන් ඉදිරියේදී නිවැරදි කරනු ලැබේ. | අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීමට හා මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදි අගයන් දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගෙවිය යුතු ජාතිය ගොඩ නැංවීමේ බදු වගකීම (NBT) රු.මිලියන 3.31 ක් වර්ෂ 3 කට අධික කාලයක සිට ණය හිමියන් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම දක්වා තිබුණද වර්තමානයේ එම බදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොවන තත්ත්වයක් යටතේ මෙම වටිනාකම නිරවුල් කර ගැනීමට 2024 වර්ෂය අවසානය තෙක් කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව ක්‍රියාමාර්ග ඉදිරියේදී ගනු ලැබේ. | මෙම ශේෂය කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| **(අ)** | 2009 අංක 66 දරන පනතින් සංශෝධිත 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ | | | |
| | (i) 12(ඉ) වගන්තිය | ඛනිජ ද්‍රව්‍ය පදනම් වූ නිෂ්පාදන සංවර්ධනය කිරීම මගින් ඒවා ප්‍රවර්ධනය කිරීම, නිශ්කර්ෂණය කිරීම, වටිනාකම් එකතු කිරීම සඳහා සහ වාණිජමය පදනමක් මත එකී ඛණිජ ද්‍රව්‍ය පදනම් වූ නිෂ්පාදන අපනයනය සඳහා උපයෝගී කරගත යුතු පියවර පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දිය යුතු වුවත්, එසේ කල බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | ඛනිජ සඳහා අගය එකතු කිරීමේ නිර්නායක, ඇතුළත් වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇත. | ඛනිජ ද්‍රව්‍ය සඳහා අගය එකතු කිරීමට සහ වාණිජමය පදනමක් මත එකී ද්‍රව්‍ය පදනම් වූ නිෂ්පාදන අපනයනය සඳහා උපයෝගි කර ගත යුතු පියවර පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් ලබාදිය යුතුය. |
| | (ii) 52(2) වගන්තිය | බලපත්‍ර දරන්නෙකු විසින්, ඔහුගේ බලපත්‍රයෙන් බලය දෙන ලද කටයුතු අවසන් වූ පසු හෝ ඔහුගේ බලපත්‍රයේ කාලය ඉකුත් වන දිනය යන දින දෙකෙන් කලින් එළඹෙන දිනයේදී, කාර්යාංශය සෑහීමකට පත්වන පරිදි ඉඩම් පුනරුත්ථාපනය කළ යුතු වුවද 2025 අගෝස්තු 11 දින වන විට බලපත්‍රලාභීන් 2713 ගෙන් ලබාගත් රු.මිලියන 462.26 ක පුනරුත්ථාපන බැඳුම්කරවලට අදාළ මුදල් කාර්යාංශය තුළ රඳවාගෙන තිබුණි. එයින් රු.මිලියන 316.64 ක් වටිනා බලපත්‍ර 1742 ක භූමි පුනරුත්ථාපන කටයුතු සිදුකරවා ගැනීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි. තවද මුදල් කරවා ගැනීමට කාර්යාංශය අපොහොසත් වී තිබූ බැඳුම්කර රු.මිලියන 62.56 ක බලපත්‍ර 268 කට අදාළ පුනරුත්ථාපන කටයුතුද සිදු කරවා ගැනීමට | 2025.08.11 දිනට රු.මිලියන 462.26 කට පුනරුත්ථාපන බැඳුම්කර ශේෂයකට අදාළ කැණීම් භූමි 2713 න් රු.මිලියන 316.40 ක වටිනාකමකින් යුත් කැණීම් භූමි 1742 ක පුනරුත්ථාපන කටයුතු සම්පූර්ණ කර බවට වාර්තා වී නොමැත.<br>පුනරුත්ථාපන බැඳුම්කරයේ වටිනාකම බැංකුව වෙතින් කාර්යාංශය වෙත ලැබී නොමැති භූමි 268 කට අදාළව පුනරුත්ථාපන කටයුතු සිදුවී ඇති බව තහවුරු වී නොමැත. | පුනරුත්ථාපනය කරන ලද හා නොකරන ලද ඉඩම් මොනවාද යන්න නිශ්චිතව හඳුනා ගැනීමට කාර්යාංශය විසින් වැඩපිළිවෙලක් හඳුන්වාදිය යුතුය.<br>ඉඩම් පුනරුත්ථාපනය කිරීමට හා බැඳුම්කර මුදල් ආපසු ලබා ගැනීමට උනන්දු කර වීම සඳහා බැඳුම්කර මුදල ලෙස පුනරුත්ථාපනය කිරීමට ප්‍රමාණවත් මුදලක් ලබාගත යුතු අතර බලපත්‍ර හිමියා ඉඩම් පුනරුත්ථාපනය නොකරන්නේ නම් නීතිමය පියවර ගැනීම සිදුකිරීමට |

| | | | | |
|---|---|---|---|---|
| | | කාර්යාංශය අපොහොසත් වී තිබුණි. | | වැඩ පිළිවෙලක් හඳුන්වාදිය යුතුය. මුදල් කරවා ගැනීමට අපොහොසත් වූ බැදුම්කර සම්බන්ධයෙන් පරීක්ෂණයන් පවත්වා රජයට සිදුවී ඇති අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගත යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ ඇතුළත් රාජ්‍ය ව්‍යවසායන්හි යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශය | | | |
| | (i) 2.2.5 ඡේදය | කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලය විසින් පරිපාලිත සමාගමේ ක්‍රියාකාරීත්වය නිතිපතා සමාලෝචනය කිරීම, කාර්යාංශයට බලපෑමක් ඇති අවදානම් සහ අනෙකුත් ගැටලු පිළිබඳව දැනුවත් වීම, අන්තර් සමාගම් ගනුදෙනු සමීපව නිරීක්ෂණය කිරීම සිදු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | විගණනය දක්වා ඇති කරුණු වලට එකඟ වන අතර, ඉදිරි කළමණාකරන රැස්වීමේදී පරිපාලිත සමාගමේ කටයුතු අධීක්ෂණය කිරීමට කටයුතු කරනු ලැබේ. | පරිපාලිත සමාගමේ කටයුතු නිතිපතා සමාලෝචනය කිරීමට, අවධානම් ගැටලු හඳුනා ගැනීමට හා අන්තර් සමාගම් ගනුදෙනු සමීපව නිරීක්ෂණය කිරීම සඳහා වැඩපිළිවෙලක් හඳුන්වා දිය යුතුය |
| | (ii) 2.3 ඡේදය | රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව උපායමාර්ගික සැලැස්ම පිළියෙල කළ යුතු වුවද 2019-2023 වර්ෂයෙන් පසු කාර්යාංශය සතුව අනුමත උපායමාර්ගික සැලැස්මක් නොතිබුණි. | 2024-28 කාලය සඳහා උපායමාර්ගික සැලැස්ම සකස් කර ඇති නමුත්, එය මෙතෙක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරවාගෙන නොමැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව උපායමාර්ගික සැලැස්ම සකස් කර අනුමත කරගත යුතුය. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2022 ජනවාරි 14 දිනැති PED 1/2015(II) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.1 වගන්තිය | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ (HM) 1-1 සේවා ගණයට සමාන හෝ ඊට ඉහළ නිලධාරීන්ට හිමි මාසික ඉන්ධන සීමාව ලීටර් 115 ලෙස දක්වා තිබුණද ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ (HM) 1-2 වැටුප් කාණ්ඩය හිමි | මෙම ඉන්ධන දීමනාව ලබාදීම ආරම්භ කර ඇත්තේ 2018 වර්ෂයේ ජුනි මාසයේදීය. එවකට අධ්‍යක්ෂ (මූල්‍ය) ලෙස කටයුතු කළ නිලධාරියාගේ උපදෙස් පරිදි කටයුතු සිදුකර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දීමනාව ගෙවිය යුතු අතර මේ දක්වා වැඩිපුර ගෙවූ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | අධ්‍යක්ෂ (මූල්‍ය) සඳහා 2018 සිට 2024 අගෝස්තු දක්වා ඉන්ධන ලීටර් 135 ක දීමනාවක් මාසිකව ගෙවා තිබුණි. | එහෙත් 2024 වර්ෂයේ අගෝස්තු මස පරිසර අමාත්‍යාංශයේ පවත්වන ලද විමර්ශන කටයුත්තකදී මෙය සංශෝධනය විය යුතු බව පෙන්වා දුන් අතර, ඒ අනුව 2024 වර්ෂයේ සැප්තැම්බර් මස සිට ඉන්ධන ලීටර් 115ක් ගෙවීමට කටයුතු සිදුකරන ලදී. | |
| (ඇ) | 2023 මාර්තු 29 දිනැති අංක SEC/2023/E/01 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සේවා යෝජකයින් සඳහා වන උපදෙස් මාලාව | ආදායම් බදු ගෙවීමට බැඳී සිටින සෑම සේවා නියුක්තිකයෙකුගෙන්ම දේශීය ආදායම් පනතේ 5 වන වගන්තිය යටතේ සේවා නියුක්තිය මගින් වන ලැබීම් සහ ලාභ ලෙස ඇතුළත් කළ හැකි ඕනෑම ගෙවීමක් මත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් බදු චක්‍ර මගින් නිශ්චය කළ පරිදි සෑම සේවා යෝජකයෙකුම 2023 ජනවාරි 01 වන දින සිට අත්තිකාරම් පුද්ගල ආදායම් බදු අඩු කළ යුතු වුවද, 2023 ජනවාරි මස සිට 2024 අගෝස්තු මස දක්වා කාර්යාංශයේ නිලධාරීන් වෙත ගෙවා තිබූ රු.මිලියන 7.72 ක් වූ ඉන්ධන දීමනාව මත අත්තිකාරම් පුද්ගල ආදායම් බදු අඩු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට නිවැරදි කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දීමනාව සඳහා වූ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු අඩු කළ යුතු අතර අඩුවෙන් අඩුකර ඇති ආදායම් බද්ද අදාළ නිලධාරීන්ගෙන් අඩු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2023 පෙබරවාරි 20 දිනැති අංක 231/02/2023 දරන කාර්යාංශයේ අභ්‍යන්තර චක්‍රලේඛය. | විශේෂ අවසරපත්‍ර අලුතින් නිකුත් කිරීම හෝ දැනටමත් නිකුත් කර ඇති බලපත්‍රවල කාලය දීර්ඝ කිරීම උපරිම අවස්ථා 2 ක් පමණක් වන පරිදි නිකුත් කළ යුතු වුවත්, නියැදි විගණන පරීක්ෂාවේදී අවස්ථා 13 කදී එම උපරිම අවස්ථාව ඉක්මවා විශේෂ බලපත්‍ර නිකුත් කර තිබුණි. | විශේෂ අවසරපත්‍ර ලබාදීමේදී සිදුවිය හැකි අවභාවිතයන් වළක්වා ගැනීමේ අරමුණින් දීර්ඝ කිරීමේ අවස්ථා 02 කට සීමා කර ඇත. එහෙත් කාර්යාංශයේ මතය අනුව නිකුත් ඇති සමහර විශේෂ අවසරපත්‍ර වලට අදාළ කර ඇති කාර්යයේ ස්වභාවය මත කාලය දීර්ඝ කිරීමේ අවශ්‍යතාවයක් පවතින්නේ නම් ඛනිජ නියාමනය කිරීමේ අරමුණින් අදාළ | විශේෂ බලපත්‍ර අලුත් කිරීමේදී උපරිම අවස්ථා ගණන ඉක්මවා කටයුතු නොකළ යුතු අතර එසේ සීමාවන් ඉක්මවා කටයුතු කළ අවස්ථාවල අවභාවිතයන් සිදුවී තිබේද යන්න සම්බන්ධයෙන් පරීක්ෂාවන් සිදුකර වගකිව යුතු |

| | | |
|---|---|---|
| | විශේෂ අවසර පත් තවදුරටත් දීර්ඝ කිරීමට කාර්යාංශයට සිදුවේ. නමුත් මෙම ක්‍රියාමාර්ග ඉහත චක්‍රලේඛයට පටහැනි වුවත් අධ්‍යක්ෂ ජනරාල්ට මේ සම්බන්ධව තීරණය ගත හැකි බැවින්, එවැනි අවස්ථාවලදී එම අවශ්‍යතාවය සලකා එයට අදාල වන සේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව පමණක් සිදුකර ඇත. | නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 701.54 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු. මිලියන 1,159.67 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 458.13 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වර්ෂයේ ආදායම රු.මිලියන 319.66 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2024 ඔක්තෝබර් 08 වන දින ප්‍රකාශයට පත්කළ අංක SCAppeal 137/2017 දරන ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව ප්‍රකාරව කාර්යාංශය විසින් බලපත්‍ර ලබාදීමේදී ඒ සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන් සඳහා සම අවස්ථාවක් ලබාදිය හැකි වන ආකාරයට බලපත්‍ර ලබාදිය යුතු විය. එසේ වුවද පවත්නා ක්‍රමවේදය, නඩු තීන්දුවට අනුකූලව නැවත සමාලෝචනය කළ යුතු බව කාර්යාංශය තීරණය කර ඒ අනුව එම ක්‍රමවේදය යළි සකස් කරන තෙක් ගවේෂණ බලපත්‍ර නිකුත් කිරීම කාර්යාංශය විසින් එදින සිට තාවකාලිකව අත්හිටුවා තිබුණි. එසේ වුවද එම ක්‍රමවේදය 2025 මැයි 30 දින වන විටත් සකස් කර නොතිබුණු අතර ප්‍රධාන ආදායම් උත්පාදන මාර්ගයක් ලෙස හඳුනාගත හැකි ගවේෂණ බලපත්‍ර නිකුත් කිරීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් 2025 මැයි 30 වන විට අයදුම්කරුවන් 50 දෙනෙකු ගෙන් ලද රු.මිලියන 75.32 ක බලපත්‍ර ගාස්තු, අත්තිකාරම් ගිණුමේ රඳවා තබා ගැනීමට කාර්යාංශයට සිදුවී තිබුණි. | මේ සඳහා කමිටුවක් පත් කර ඇති අතර, මේ වනවිට කෙටුම්පත අවසන් කර ඇත.<br>ඉහත කමිටු වාර්තාව ලැබුණු පසු කටයුතු කරනු ලැබේ. | බලපත්‍ර ලබාදීමේදී ඒ සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන්ට සම අවස්ථාවක් ලබාදීමට හැකිවන ආකාරයට ක්‍රමවේදය කඩිනමින් සකස් කර බලපත්‍ර නිකුත් කිරීම ආරම්භ කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හලාවත වැවිලි සමාගමට අයත් පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි මුක්කුතොඩුවාව වතුයායේ වැලි ඉවත් කිරීම සඳහා පුද්ගලික සමාගමක් වෙත මාසික නිෂ්පාදන පරිමාව කියුබ් 500 කට නොවැඩි සහ කැණීම් කළ හැකි මුළු කියුබ් ප්‍රමාණය කියුබ් 9400 නොවැඩි යන කැණීම් කොන්දේසි යටතේ අංක IML/C/HO/N/17006 දරන කාර්මික කැණීම් බලපත්‍රය නිකුත් කර තිබුණි. මෙම බලපත්‍රය 2023 දෙසැම්බර් 14 දින සිට 2024 සැප්තැම්බර් 13 දක්වා අවස්ථා 3 කදී අළුත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ. | | |
| (i) | ජී එස් එම් බී ටෙක්නිකල් සර්විසස්(පුද්) සමාගම විසින් 2024 දෙසැම්බර් මස 19 වන දින නිකුත් කරන ලද කැණීම් කරන ලද වැලි පරිමාව ඇස්තමේන්තු කිරීමේ වාර්තාව ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් වැලි කියුබ් 36,531 සිට 45,561 ක පරාසයක වැලි තොගයක් ඉවත් කර කියුබ් 1594 ක් සඳහා පමණක් රාජ්‍යභාගය ලෙස රු.686,464 ක් කාර්යාංශය වෙත ගෙවා තිබුණි. වාර්තාවේ පහළ පරාසය පමණක් සැලකිල්ලට ගැනීමේදී කියුබ් 34,937 ක් සඳහා රු.මිලියන 12.73 ක රාජ්‍යභාගය ගෙවා නොතිබුණි. | එම බලපත්‍රයේ කොන්දේසි අංක 06 අනුව මාසික නිෂ්පාදන පරිමාව කියුබ් 500කට නොවැඩි සහ කැණීම් සිදුකළ හැකි මුළු කියුබ් ප්‍රමාණය 9400කට නොවැඩි විය යුතුය යන්න සඳහන් කර ඇත. | අහිමි කරගත් රාජ්‍යභාගය අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර අධීක්ෂණය භාර නිලධාරීන් ඔවුන්ගේ වගකීම ඉටු නොකිරීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | වැලි කියුබ් 2920 ක් පමණක් ප්‍රවාහනය කිරීම සඳහා බලපත්‍ර කාර්යාංශය වෙතින් ලබාගෙන තිබියදී වාර්තාවේ පහළ පරාසය සලකා බැලීමේදී කියුබ් 33,611 ක වැලි තොගයක් බලපත්‍ර රහිතව ප්‍රවාහනය කර තිබුණි. | 2023.12.18 වන දින සිට 2029.08.12 දින දක්වා කාල සීමාව තුල කාර්යාංශය තුළ මෙම බලපත්‍රයට අදාළව කියුබ් 2920 ට අදාළව ප්‍රවාහන බලපත්‍ර 103 ක් නිකුත් කර ඇත. | අහිමි කරගත් බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iii) | 2024 සැප්තැම්බර් 13 දක්වා බලපත්‍රය අලුත් කිරීමට අදාළව පැනවූ නව කොන්දේසිය ප්‍රකාරව කාලසීමාව ඉකුත් වන දිනයේදී කැණීම් කරන ලද භූමිය කාර්යාංශය සෑහීමකට පත්වන පරිදි පුනරුත්ථාපනය කළ යුතු බව දක්වා තිබුණද මෙම පුනරුත්ථාපන කටයුතු අවශ්‍ය පරිදි සිදුකර තිබේද යන්න පරීක්ෂා කිරීමට පුත්තලම ප්‍රාදේශීය කාර්යාලය විසින් 2025 මැයි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව ක්ෂේත්‍ර පරීක්ෂණ කර අදාළ වාර්තාව ලබාදීමට නියමිතය. | පුනරුත්ථාපන කටයුතු නිසි පරිදි සිදු වුවාද යන්න සඳහා කඩිනමින් පරීක්ෂණයක් පවත්වා පනතේ විධිවිධාන පරිදි අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් (ERP) ස්ථාපිත කිරීම සඳහා රු. මිලියන 1.63 ක් වැය කර තිබුණද 2023 පෙබරවාරි 20 දින එම කාර්ය ක්‍රියාත්මක නොකිරීමට කාර්යාංශය තීරණය කර තිබුණි. එසේ වුවද කාර්යාංශයේ වර්තමාන මෙහෙයුම් හා මූල්‍ය අවශ්‍යතාවයන්ට ගැලපෙන ආකාරයට ERP පද්ධතියක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය වුවත් මේ දක්වා ඒ සඳහා කටයුතු නොකර වසර 20 කට වඩා පැරණි, කාර්යාංශයේ මෘදුකාංග පද්ධතිය වාර්ෂිකව රු.මිලියන 1.04 ක නඩත්තු වියදමක් දරා භාවිතා කරමින් පවතී. ERP පද්ධතිය ස්ථාපිත කිරීමේ අරමුණින් රු.මිලියන 20.39 කට මිලදී ගත් පරිගණක 60 මේ වන විට ප්‍රාදේශීය කාර්යාල වෙත ලබා දී තිබුණි. | වාර්ෂික අයවැයේ වෙන්කර තිබූ ප්‍රතිපාදන අනුව මිල දී ගැනීමට නියමිතව තිබූ පරිගණක 60 ද මෙම ව්‍යාපෘතියටත් යොදා ගැනීමේ ද්විතීක අරමුණ පෙරදැරිව අයවැයෙන් වෙන්කළ ප්‍රතිපාදන මත අදාළ පරිගණක තොගය මිල දී ගැනීමට කටයුතු ඒ සමගාමීව සිදු කරන ලදි.<br>ERP පද්ධතිය ස්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු මේ වන විටත් සිදු වෙමින් පවතින අතර සුදුසු මෘදුකාංග සංවර්ධනය කරන ආයතනයක් තෝරා ගැනීමට තිබූ තාක්ෂණික බාධා හේතුවෙන් කාර්යය ප්‍රමාද වී ඇත.<br>එහෙත් වාර්ෂික අවශ්‍යතාව අනුව මිල දී ගත් පරිගණක 60 එම ප්‍රාදේශීය කාර්යාල වල දෛනික අවශ්‍යතා වෙනුවෙන් මේ වන විට නිකුත් කර ඇති අතර ඒ හරහා බලපත්‍ර නිකුත් කිරීමේදී පරිගණක වල පැවති තාක්ෂණික බාධා මඟහරවා ගනිමින් යම්තාක් දුරකට ඒවා ක්‍රමවත් කර ගැනීමට හැකිව ඇත.<br>ERP පද්ධතිය ස්ථාපනයට දෙවන අදියර නැවත ක්‍රියාත්මක වෙමින් පවතින අතර මිල දී ගත් පරිගණක දෛනික අවශ්‍යතාවය සඳහා යොදා ගනිමින් බලපත්‍ර නිකුත් කිරීම ක්‍රමවත් කර ගෙන ඇති බැවින් මේ සඳහා දරා ඇති වියදම් නිශ්කාර්යය වී නොමැත. | ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් ස්ථාපිත කිරීමේ කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු අතර ප්‍රාග්ධන අයවැයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන භාවිතා කිරීමේදී එහි අවශ්‍යතාවය විධිමත් පරිදි හඳුනා ගැනීම සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2012 වර්ෂයේ සිට 2025 අගෝස්තු 11 දින දක්වා කාලපරිච්ඡේදය තුළදී කැණීම් බලපත්‍ර 362 කට අදාළ රු.මිලියන 80.87 ක් වටිනා බැඳුම්කර, මුදල් කරවා ගැනීම සඳහා අදාළ බැංකු වෙත ඉදිරිපත් කර තිබුණද, එම මුදල් කාර්යාංශය වෙත ලැබී නොතිබුණ අතර වර්තමානය වන විට මෙම බැඳුම්කර කල් ඉකුත් වී තිබුණි. ඊට අමතරව රු.මිලියන 15.75 ක් වටිනා බැඳුම්කර 75 ක් 2020 වර්ෂයේදී කල් ඉකුත් වීමට පෙර මුදල් කර ගැනීම සඳහා බැංකු වෙත ඉදිරිපත් කිරීමක්ද සිදුකර නොතිබුණි. ඒ අනුව රු.මිලියන 96.62 ක බැඳුම්කර මුදලක් කාර්යාංශයේ පසු විපරමක් සිදු නොවීම හේතුවෙන් ලබා ගත නොහැකිවී තිබුණි. | මෙම බලපත්‍ර 362 ට අදාළ බැංකු ඇපකර අත්පත් කර ගැනීමට බැංකු වෙත ලිපි යොමු කර සිහිකැඳවීම් ලිපිද යොමුකර ඇත. එසේ වුවද බැංකුව වෙතින් කාර්යාංශය වෙත මුදල් බැර කර නොමැත.<br>කොවිඩ් වසංගතය පැවති සමයේ කල් ඉකුත් වීමට පෙර බැංකුව වෙත අත්පත් කර ගැනීමට ලිපි යැවීම ප්‍රමාද වූ බැංකු ඇපකර 75 සඳහා කාර්යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විමර්ෂණයක් සිදුකරමින් පවතී. | මෙයින් සිදුවූ අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 අනාර්ථික ගනුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2022 වර්ෂයේ රු.මිලියන 4.4 ක් වැය කර ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ස්ථාපිත කර තිබූ ඉන්ධන ටැංකිය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිශ්කාර්යව පැවතුණි. | ඇතිවූ හදිසි ඉන්ධන හිඟකමට පිළියම් ලෙස මෙය ස්ථාපනය කල ද පසුව ඉන්ධන සැපයීම ක්‍රමවත් වීමත් ටැංකිය හා පොම්පය ස්ථාපනය කළ අවධියේම ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ රුපියල් ගිණුම් හරහා ඉන්ධන නිකුතුව අත්හිටුවා ඩොලර් ගිණුම් වලට පමණක් ඉන්ධන තොග නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය හේතුවෙන් මෙය අපේක්ෂා කළ පරිදි ප්‍රයෝජනයට ගැනීමට නොහැකි විය.<br>අධ්‍යක්ෂ මණ්ඩලය ලබා දී ඇති උපදෙස් පරිදි තුන්වන වරටත් පුවත්පත් දැන්වීමක් හරහා මෙය විකිණීමට උත්සාහ දරමින් සිටී. | අත්‍යාවශ්‍ය නොවන වියදම් සිදු කිරීමට තීරණය කළ නිලධාරීන් මෙම නිෂ්කාර්ය වියදම සඳහා වගකිව යුතු අතර ටැංකිය විකිණීමට කටයුතු සිදු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 21 දින සිට අනිවාර්ය නිවාඩු යවා තිබුණු අධ්‍යක්ෂ (මානව සම්පත්) සම්බන්ධයෙන් මූලික විමර්ශනය 2024 සැප්තැම්බර් 10 පවත්වා තිබුණි. නිලධාරියාට විරුද්ධව චෝදනා නැගීමට තරම් ප්‍රමාණවත් හේතු සාධක ඇති බව මූලික විමර්ශනය මගින් බැලූ බැල්මට පෙනී යන්නේ නම්, අදාළ විනය බලධරයා විසින්, චෝදනා පත්‍රයක් නිලධාරියා වෙත විධිමත්ව නිකුත් කළ යුතු වුවද, එසේ කර නොතිබුණ අතර විධිමත් විනය පරීක්ෂණය ද පවත්වා නොතිබුණි. එබැවින් වසර 1 ½ ට වැඩි කාලයක් සඳහා ඔහුගෙන් සේවයක් නොලබා වැටුප් ගෙවමින් පැවතුණ අතර 2025 මැයි දක්වා එසේ ගෙවා ඇති මුදල රු.මිලියන 1.89 ක් විය. | මූලික විමර්ශන වාර්තාවට අනුව එහි නිර්දේශ වල සඳහන්ව ඇත්තේ, අධ්‍යක්ෂ මානව සම්පත් තනතුරට අදාළ බඳවාගැනීම් පටිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති බැවින් හා කාර්යාංශයේ නිලධාරිනියන් විසින් අවස්ථා කිහිපයකදී ලබාදී ඇති ප්‍රකාශවල කරුණු සමාන බැවින් ඔහු තවදුරටත් අදාළ තනතුරෙහි සේවයේ යෙදවීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සුදුසු බව<br>- නිදහසට කරුණු විමසීම සඳහා ඔහු විසින් පිළිතුරු ලබාදී නොමැති වුවත් ඔහුගේ තනතුර තවදුරටත් වලංගු නොවන බැවින් විනයානුකූලව කටයුතු කිරීමේ අවශ්‍යතාවයක්ද මතු නොවන බව<br>එම නිර්දේශ අනුව තීරණයක් ගැනීම සඳහා කළමනාකරණ මණ්ඩලය වෙත යොමු කිරීමෙන් අනතුරුව ඔවුන් විසින් දන්වා සිටියේ සුදුසුකම් හා පළපුරුද්ද නැවත පරීක්ෂා කිරීම සඳහා කාර්යාංශයෙන්ද, පරිසර අමාත්‍යාංශයෙන්ද හා රාජ්‍ය පරිපාලන ,ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මඟින් තීරණයක් ලබාගන්නා ලෙසයි. ඒ අනුව අදාළ කමිටුව කටයුතු කරමින් පවතී. | පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2024 මැයි 17 දිනැති 344 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමේ තීරණය ප්‍රකාරව 2024 ජුලි 15 දින සිට මානව සම්පත් උපදේශකවරයෙකු කොන්ත්‍රාත් පදනමින් කාර්යාංශය වෙත බඳවා ගැනීමට හා ඔහුගේ වැටුප ලෙස මානව සම්පත් අධ්‍යක්ෂකගේ මූලික වැටුප යොදා ගැනීමට අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව මානව සම්පත් | කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත මානව සම්පත් උපදේශක බඳවාගන්නා ලදී.<br><br>මානව සම්පත් අංශයේ | වැඩිපුර ගෙවූ වැටුප් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර උපදේශකවරයාගේ කාර්යභාරයන් නිසි ලෙස සිදු කරන්නේද |

| | | | |
|---|---|---|---|
| | අධ්‍යක්ෂවරයාට ගෙවිය යුතු මූලික වැටුප රු.81,670 ක්ව තිබියදී රු.175,000 බැගින් 2024 ජූලි 15 වන දින සිට 2025 අප්‍රේල් 15 දින දක්වා ගෙවා තිබුණ අතර, මෙහිදී වැඩියෙන් වැටුප් ලෙස රු.839,933 ක් ගෙවා තිබුණි. එසේම කාර්යාංශයේ මානව සම්පත් සැලැස්ම පිළියෙල කිරීම සහ මානව සම්පත් විගණනයක් සිදු කිරීමට අදාළ කාර්යභාරය මෙම උපදේශකවරයා වෙත පවරා තිබුණද එම කටයුතු ඉටුකර තිබේද තහවුරු කරගත නොහැකි විය. | ක්‍රියාකාරී ලෙස දායකත්වය දීමට අවශ්‍ය සැලැස්ම පිළියෙල කොට සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් වෙත භාරදී ඇති අතර, එය කළමණාකරන මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කර ඇත. | යන්න තහවුරු කරගත යුතුය. |
| (ඇ) | නීති විරෝධී ලෙස සිදු වන ඛනිජ කැණීම්, සකස් කිරීම්, වෙළඳාම් කිරීම් වැටලීමේ අරමුණින් බලගැන්වීමේ ඒකකයක් ස්ථාපිත කර තිබුණද අනුමත බලගැන්වීමේ නිලධාරී තනතුරු 06 න් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් තනතුරු 3 ක් දිගින් දිගටම පුරප්පාඩුව පැවතීම හේතුවෙන් නීති විරෝධී වැටලීම් සිදු කිරීමට බාධාවක් වී තිබුණි. | පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ බඳවා ගැනීම් සමාලෝචනය කිරිමේ කමිටුව වෙත පරිසර අමාත්‍යාංශය හරහා ලිපියක් යොමු කර ඇත. පරිසර අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත අදාළ ලිපිය යොමු කර ඇති බව දන්වා අප වෙත ලිපියක් යොමු කර ඇත. | සේවක පුරප්පාඩු පිරවීමට හා නීති විරෝධී වැටලීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |